දිවි අහිමි කර ගැනීම් වාර්තා කිරීමේදී ඊට අදාළව පවතින ආචාර ධර්ම අනුගමනය කිරීම වැදගත් වන්නේ, ආචාර ධාර්මික නොවන, වගකීම් සහගත නොවන ලෙසකින් දිවි අහිමි කර ගැනීම් වාර්තා කිරීම ඔස්සේ චක්‍රාකාරයෙන් තවත් දිවි අහිමි කරගැනීම් වෙත පෙළැඹවීම් ඇති කිරීමේ හැකියාවක් පවතින බව පර්යේෂකයින් පවසන නිසාවෙනි.

ඇතැම් විටක දිවි අහිමි කරගත් ප්‍රවෘත්තියක් මහජන ලැදියාවට අදාළ වීමට පිළිවන. විශේෂයෙන්ම ආරක්ෂක අංශයක නිලධාරියෙකු තමන්ගේ රැකියාවට අදාළ වන ආකාරයක් භාවිතා කරමින් දිවි අහිමි කරගන්නේ නම් එය මහජන ලැදියාවට අදාළ වේ යැයි ගත හැක. එනමුත්, එවන් අවස්ථාවකදී වුවත් දිවි අහිමි කරගත් ආකාරය ප්‍රමුඛතාවයකින් යුතුව දැක්වීම යෝග්‍ය යැයි ඔබ සිතන්නේද? එසේම දිවි අහිමි කරගත් පුද්ගලයාට ඒ සම්බන්ධයෙන් දෝෂාරෝපණයන් එල්ල කිරීමද යෝග්‍ය නොවන බව කිව යුතුවේ.

එසේම උපකාරක අංක සඳහන් කිරීම, දිවි අහිමි කර ගැනීම් සම්බන්ධයෙන් ආචාර ධාර්මික වාර්තාකරණයකට අත්‍යාවශ්‍ය බවද සඳහන් කළ යුතු වේ.

මූලාශ්‍ර:

https://apps.who.int/iris/bitstream/handle/10665/258814/WHO-MSD-MER-17.5-eng.pdf;jsessionid=D14833A4878E3B3D96D0721858FB5F4E?sequence=1

https://accountablejournalism.org/ethics-codes/australia-standards-of-practice-suicide-reporting

හදිසි උපකාරක අංක:

*1333-CCCline

* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ -0112696666

*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

#MediaEthicsSL #lka #SinhalaPress #News #Lankadeepa #Aruna #Divaina #Mawbima